# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை

# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 916/7 – 1996 මාර්තු 27 වැනි බදාදා – 1996.03.27

916/7 ஆம் இலக்கம் — 1996 ஆம் ஆண்டு மாச்சு மாதம் 27 ஆம் திகதி புதன்கிழமை

No. 916/7 – WEDNESDAY, MARCH 27, 1996

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)


## I වැනි කොටස : (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.–බී. 21/78 IV.

### 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

### 27 (1) වන වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය රිචඩ් පතිරණ වන මම, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24 අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය පිහිටුවමින් 1995 ජූලි මස 26 වැනි දින අංක 881/9 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමය, 1996 මැයි මස 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මේ නියමයෙන් ප්‍රත්‍යාදිෂ්ට කරමි.

රිචඩ් පතිරණ,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය.

1996 මාර්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.
04 –293/1

---

එල්. ඩී.–බී. 21/78 IV.

### 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

### 21 වන වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 21 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය රිචඩ් පතිරණ වන මම, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන් –

(i) කලා හා සංස්කෘතිය, කළමනාකරණය හා වාණිජ්‍යය, ව්‍යවහාරික විද්‍යා යන අධ්‍යයන අංශයන්හි උසස් අධ්‍යාපනය ලබාදීමේ, ප්‍රවර්ධනය කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා වූ විශ්ව විද්‍යාලයයක් 1996 මැයි මස 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි පිහිටුවමි;

(ii) ඒ විශ්ව විද්‍යාලයට "ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය" යන නාමය හා අභිධානය දෙමි;

(iii) ඒ විශ්ව විද්‍යාලය පිහිටා තිබිය යුතු ප්‍රදේශය වශයෙන් අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය නියම කරමි;

(iv) කලා හා සංස්කෘතිය, කළමනාකරණය හා වාණිජ්‍යය සහ ව්‍යවහාරික විද්‍යා යන පීඨ ඒ විශ්ව විද්‍යාලයට පවරමි;

(v) මෙහි උපලේඛනයේ 1 වැනි තීරයේ දක්වා ඇති ඒ විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨය, ඒ උපලේඛණයේ 2 වැනි තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති අධ්‍යයන අංශවලින් සමන්විත විය යුතු බව නියම කොට දක්වමි.

රිචඩ් පතිරණ,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය.

1996 මාර්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

## උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය |
| --- | --- |
| කලා හා සංස්කෘතික පීඨය | සමාජ විද්‍යා අංශය<br>භාෂා අංශය |
| කළමනාකරණ හා වාණිජ්‍යය පීඨය | කළමනාකරණ අංශය<br>ගණකාධිකරණ හා මූල්‍ය අංශය |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ජීව විද්‍යා අංශය<br>භෞතික විද්‍යා අංශය<br>ගණිත විද්‍යා අංශය |

04 –293/2